INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

JDS Journalists for Democracy in Sri Lanka

2021 මැයි 13

## ඒකාබද්ධ ප්‍රවෘත්ති නිවේදනය: ශ්‍රී ලංකාවේ මොහාන් පීරිස් එජා සංවිධානයේ නීති සකස්කිරීම සඳහා සුදුස්සෙක් නොවේ


W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA


**ජොහැන්නස්බර්ග්:** ජාත්‍යන්තර ආයතන සහ නීතියේ ආධිපත්‍යය නොමග යැවීමේ විස්මය දනවන වීරියක් දරමින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් රටේ ප්‍රධාන නීති නිලධාරියා වශයෙන් සිටියදී සිදුකෙරුණු බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, ඝාතන, වධබන්ධන සහ ලිංගික දූෂණ සිදුකළ අපරාධකරුවන් වගඋත්තරදායකත්වයෙන් බැඳ තැබීමට අසමත් වීම නිසා අවමානයට පාත්‍ර වූවකු එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර නීති කොමිසමේ[1] අපේක්ෂකත්වය සඳහා නාම යෝජනා කර ඇත. මොහාන් පීරිස් දැන් නිව් යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතයා වෙයි. එහෙත් 2008-11 කාලයේ ශ්‍රී ලංකාවේ නීතිපති ලෙස රාජකාරි කළ අවදියේ ඔහු යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ වලට වගකිව යුත්තන්ට එරෙහිව නීතිමය පියවර ගන්නට අසමත් වූයේය. 2013 දී ඔහු අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් කරන ලද්දේ ඔහුගේ පූර්ව ප්‍රාප්තිකා ශිරානි බණ්ඩාරනායක ආණ්ඩුව විසින් නීති විරෝධී ලෙස දෝෂාභියෝගයකින් ඉවත් කිරීම පිළිබඳව නැගුනු ජාතික හා ජාත්‍යන්තර විරෝධය මධ්‍යයේය. එය අධිකරණයේ ස්වාධීනත්වයට එරෙහි ප්‍රහාරයක් ලෙස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් හඳුන්වන ලද අතර නීති විරෝධී බවට ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කරන ලදී.[2]

"ජාත්‍යන්තර නීති සම්පාදනයේ යෙදෙන එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර නීති කොමිසමේ ඇතැම් මෑත කටයුතු අදාළ වූයේ මුක්තිය, උද්ර්පණය සහ මානව වර්ගයාට එරෙහි අපරාධ වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙනි. මොහුට ඡන්දය නොදෙන ලෙස සියලු නීතිඥයන්ද, වඩාත් යුක්ති සහගත ලෝක ධර්මතාවක් ගැන සැලකිලිමත් වන්නන්ද, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සාමාජිකයන්ට බලකර සිටිය යුතුය," යි සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP) විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය.

"පීරිස්ගේ ධුර සමයේ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් සිදුකරන ලද බවට චෝදනා කෙරෙන බරපතල ජාත්‍යන්තර ගනයේ අපරාධ සම්බන්ධයෙන් කිසිවකුත් වගකීමෙන් බැඳ නැත. ඔහු නිව් යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ සංවිධානය තුල ශ්‍රී ලංකාව නියෝජනය කරන ඉහළම රාජ්‍ය දූතයා ලෙස පත් කර එවීම මගින් ශ්‍රී ලංකාව වගඋත්තරදායකත්වය සම්බන්ධයෙන් දක්වන නොසැලකිල්ල පෙන්වන පිළිකුල් සහගත සංඥාවක් මේවන විටත් නිකුත් කර ඇති අතර එය තවමත් යුක්තිය ළඟා වී නැති දහස් සංඛ්‍යාත පීඩිතයන්ට එල්ල කළ අතුල් පහරකි," යි ඇය වැඩිදුරටත් පැවසුවාය.

---

[1] https://legal.un.org/ilc/elections/2021election.shtml
[2] https://uk.reuters.com/article/instant-article/idUSBRE90209D20130103

“මේ පුද්ගලයා, ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් හුදෙක් සිය රැකියාවේ යෙදීම නිසාම පැහැරගෙන ගොස්, අතුරුදහන්කොට, මරා දමා, කුරිරු වධහිංසා කොට, හිරේ විලංගුවේ ලන ලද සමයක බලයේ සිටි අයෙකි. ඔහුගේ මෙන්ම ඔහුගේ ආණ්ඩුවේත් වාර්තාවට සුදුහුණු ගෑමට ඉඩ සලසන රැකියාවකට ඔහු නම් කිරීමට විරුද්ධව ලොව පුරා මාධ්‍ය අයිතිවාසිකම් සංවිධාන අප සමග සහයෝගීතාවෙන් නැගී සිටිය යුතුය,” යි ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ (JDS) සංවිධානයේ රෝහිත භාෂණ අබේවර්ධන ප්‍රකාශ කළේය.

“ඒ මාධ්‍යවේදීහු ශ්‍රී ලංකා රාජ්‍යය විසින් කරන ලද බරපතල මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධයෙන් ජාත්‍යන්තර නෛතික මැදිහත්වීමක අවශ්‍යතාව තහවුරු කළ විශ්වසනීය සාක්ෂි හෙළිදරව් කළ අය වෙති. ඔවුන්ට යුක්තිය යුක්තිය ඉටුකිරීම ප්‍රතික්ෂේප කළ අයකු  ජාත්‍යන්තර නීතිය පිළිබඳ තීරණ ගන්නා ජගත් මණ්ඩලයකට පත් කිරීම නරියකුට කුකුළන් බාර දෙන්නා හා සමානය,” යි ඔහු වැඩිදුරටත් කියා සිටියේය.

## පසුබිම් සටහන්

### යුද අපරාධ

යුද්ධයේ අවසාන භාගයේ නීතිපති ලෙසින් ජනාධිපතිවරයාටද,  රජයේ ආරක්ෂක අංශ සහ පොලිසිය ඇතුළු සියලු දෙපාර්තමේන්තු සහ රජයේ අමාත්‍යාංශවලටද නීති උපදෙස් දීමේ ප්‍රධානියා වූයේ මොහාන් පීරිස්ය.[3] පොලිස් විමර්ශකයන්ට නියෝග සහ උපදෙස් දීමේත්, අධිචෝදනා භාරදී නඩු පැවරීම සඳහා නිසියාකාරව නඩුකර සකස් කිරීමේත් බලය සහ වගකීම් ඔහු සතුව පැවැතිණි. එකල වාර්තා වූ සිවිල් වස්තුවලට ප්‍රහාර එල්ල කිරීම, සාමාන්‍ය ජනතාවට ආහාර හා ඖෂධ නොදී සිටීම, බලහත්කාර අතුරුදහන් කිරීම්, නඩු නැති ඝාතන, ආරක්ෂක හමුදා විසින් කරන ලද ලිංගික දූෂණ සහ වධහිංසා යනාදී යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ සම්බන්ධ චෝදනා ඔහු විසින් නීතිපති ලෙස ස්වාධීන සහ විශ්වසනීය ලෙස විමර්ශනය කරනු ඇතැයි අපේක්ෂා කෙරිණි.

### අත්තනෝමතික සමූහ රැඳවුම

දහස් සංඛ්‍යාත හිටපු සටන්කරුවන් සඳහා රජය විසින් පවත්වාගෙන යනු ලැබූ “පුනරුත්ථාපන වැඩ සටහන” සම්බන්ධ බරපතල නෛතික අඩුපාඩු පිළිබඳව පියවර ගන්නට අසමත් වීම ගැන, පීරිස් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසමේ (ICJ) දෝෂ දර්ශනයට ලක්වී තිබුණි. ICJ විසින් එකල එය හඳුන්වනු ලැබුවේ “නෛතික රික්තයක”[4]   ක්‍රියාත්මක වන්නක් ලෙසය. ඒ වකවානුවේ ලෝකයේ තිබූ දැවැන්තම සමූහ පරිපාලන රැඳවුම එය විය හැකි බව ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම පවසා තිබුණි.[5] ආණ්ඩුවේ නීති රාමුව සැකෙවින් දක්වන ප්‍රතිපත්ති ලියැවිල්ල කෙටුම්පත් කිරීමේ වගකීම දැරුවේ පීරිස් ය. එය බරපහල මානව හිමිකම් ප්‍රශ්න ගණනාවක් මතු කරන බව ICJ විසින් පෙන්වා දී තිබුණි. ඒ අතර: පුනරුත්ථාපනයේ අනිවාර්ය සහ ස්වේච්ඡාවෙන් නොකෙරෙන ස්වභාවය-මෙය ‘පුනරුත්ථාපිතයා’ගේ නිදහස අහිමි කරන අතර එය අපරාධයක් සම්බන්ධයෙන් වරදකරු නොකරම පුද්ගල හා සාමූහික දඬුවම් පැනවීමක් හා සමාන බව ICJ පැවසීය. එමෙන්ම, චෝදනා ගොනු කිරීමකින්, නඩු පැවරීමකින් හෝ නීතිඥ නියෝජනයකින් තොරව (එහිදී ඒ වන විට ‘භාරගන්නා කඳවුරු' තුළ  ගතකළ කාලය පුනරුත්ථාපනය ලෙස ගණනය කෙරෙන්නේද යන්න ගැන කිසිදු ඇඟවීමක් නැත) අවුරුදු දෙකක් දක්වා කාලයක් රඳවා තබා ගැනීමද ඇතුලත් වෙයි.[6] ඉන් අනතුරුව හෙළිවූ සාක්ෂි වලින් පෙන්නුම් කෙරෙන්නේ ‘පුනරුත්ථාපන’ වැඩසටහනේදී  වධබන්ධන බහුල වශයෙන් සිදුකෙරුණු බවයි. එකල අඩුම වශයෙන් 8000ක් රඳවා තිබුණු ‘පුනරුත්ථාපන' වැඩසටහනේ නීතිමය ගැටලු සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම විසින් සිය 2010 සැප්තැම්බර් වාර්තාවෙන් අනතුරු අඟවා තිබුණි. රැඳවියන්ට නිසි කාර්ය පටිපාටිය හෝ සාධාරණ නඩු විභාගයක හෝ අයිතිය ලබා දී තිබුනේ නැත. ICJ ප්‍රකාශ කළ පරිදි ඔවුන් සිටියේ “නෛතික කළු වළක” ය.[7] ඊට අමතරව, යුද්ධයේදී ඍජුවම තමන් හා  සටන් වැදුණු

---

[3] International Independent Group of Eminent Persons (IIGEP) report to donors, Page 7.

[4] Page 7 on legal vacuum. - In its September 2010 report the International Commission of Jurists (ICJ) says the establishment of the legal framework underpinning surrender, rehabilitation and reintegration of ex-combatants was the responsibility of the Attorney General. It cites a 2009 document outlining a legal framework from the AG to the Commissioner General of Rehabilitation on this issue but said it had no legal status and could not be considered a legally binding framework (footnote 40, Page 14).https://www.refworld.org/pdfid/4ca0ae592.pdf

[5] Page 5, ICJ report.

[6] https://www.icj.org/wp-content/uploads/2012/06/Sri-Lanka-mass-detention-LTTE-analysis-brief-2010.pdf

[7] Page 6.ICJ Report.

පුද්ගලයන්ගෙන් යුත් එම කඳවුරු පරිපාලනය කෙරුනේ යුද හමුදාව විසිනි. එහිදී කෙලෙසීම් සිදු වනු ඇති බව පෙරදැකීමේ හැකියාවක් තිබුණි. එමෙන්ම, එවැනි රඳවා තබා ගැනීමේ බලයක් දිගටම ස්වාධීන තුලන හා සංවරණවලින් හෝ අධිකරණ පුනරීක්ෂණයකින් හෝ තොරව යොදාගැනීම උල්ලංඝන සිදුවීමේ අවදානම බරපතල ලෙස උග්‍ර කරන බව ද ICJ විසින් අවධාරණය කරන ලදී.[8]

**යුද අපරාධ සිදු නොවූ බව කීම**

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මැනවින් ලේඛනගත කොට ඇති අපරාධ සිදු වූයේ නැතැයි පවසමින් පීරිස් එජා ආයතනවලදී ශ්‍රී ලංකා ආණ්ඩුවේ චර්යාව ආරක්ෂා කර තිබේ. හිටපු විදේශ ඇමැති මංගල සමරවීර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හමුවේ මෙසේ ප්‍රකාශ කළේය:

“වධහිංසාවට එරෙහි කමිටුව හමුවේ මොහාන් පීරිස් මහතා අසත්‍ය ප්‍රකාශ කළ බව…එම කමිටුවේ වාර්තා විසින් පවා සාක්ෂි දරනු ඇත. මෙය ජාත්‍යන්තර කරලියේ සිදුවූ අතර ඉන් අනතුරුව එහි එක් සාමාජිකයකු විසින් ඔහු ‘බොරුකාරයකු' ලෙස හඳුන්වන ලදී. එහි එක් සාමාජිකයකු විසින් ශ්‍රී ලංකාවේ අග්‍ර විනිශ්චයකාරවරයා ‘බොරුකාරයකු’ ලෙස ප්‍රසිද්ධියේ හඳුන්වන ලදී. මෙය නම්, ඉස්තරම්ම ආකාරයෙන් අධිකරණය දූෂණය කිරීමකි. මානව හිමිකම් උල්ලංඝන සහ මානව වර්ගයාට එරෙහි අපරාධ සිදු කිරීම සම්බන්ධයෙන් චෝදනා ලබන ආයතනික යාන්ත්‍රණයේ මොහාන් පීරිස් නිසැකයෙන්ම සිටියේ එහි කුණුවූ අරටුවේය.”[9]

**වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව (UNCAT), 2011**

2011 දී වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවට සහභාගි වූ ශ්‍රී ලංකාවේ නියෝජිත පිරිසේ නායකත්වය දැරුවේ මොහාන් පීරිස්ය. මේ ඔහු 2011 සැප්තැම්බරයේ නීතිපති තනතුරින් විශ්‍රාම ගියත් අමාත්‍ය මණ්ඩලයේ නීති උපදේශක වශයෙන් දිගටම කටයුතු කරමින් සිටියදීය.[10] එක්සත් ජාතීන්ගේ විශේෂඥයන්ගේ ප්‍රශ්න කේන්ද්‍ර වූයේ ශ්‍රී ලංකාවේ පැවති රහසිගත රැඳවුම් ස්ථාන සහ රැඳවුමේදී වධහිංසා කිරීම වලක්වා ලීමට ප්‍රමාණවත් පලදායී ආරක්ෂණයක් ඔහු නීතිපති සමයේ නොපැවතීම ගැනය. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, පාපොච්චාරණ සාක්ෂි ලෙස පිළිගැනීම සහ මානව හිමිකම් ආරක්ෂකයන්ට තර්ජනය කිරීම් ගැනද එක්සත් ජාතීන්ගේ විශේෂඥයෝ ප්‍රශ්න මතු කළහ.

ශ්‍රී ලංකා රජයේ ප්‍රතිචාරය “මගහැර යාමේ රඟමඩලක්”[11] බව ආසියානු මානව හිමිකම් කොමිසම සඳහන් කර තිබුණි. ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවිය විසින් ඇතැම් නීතිඥයන් ද්‍රෝහීන් ලෙස හෙලා දැකීම ගැන විමසූ කල්හි මොහාන් පීරිස් කමිටුව හමුවේ ප්‍රකාශ කළේ එසේ පළකිරීමෙන් කිසිදු හානියක් නොවන බවය. මානව හිමිකම් නීතිඥ ජේ. සී වැලිඅමුණ ගේ නිවසට අත් බෝම්බ ගැසීම ගැන ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් පීරිස් ප්‍රකාශ කළේ බෝම්බය ගැසුවේ කවුදැයි කියන්නට ප්‍රහාරයට ලක්වූ තැනැත්තා අසමත් වූ හෙයින් වරදකරු කවුදැයි හඳුනාගැනීම අසීරු බවයි.[12]

**මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ**

කාටූන් ශිල්පී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් වීම ශ්‍රී ලංකාවේ සංකේතාත්මක නඩුකරයක් ලෙසින් පවතී. ඔහු අතුරුදහන් වූයේ ශ්‍රී ලංකාවේ ජනාධිපති මැතිවරණයට දෙදිනකට පෙර 2010 ජනවාරි 24 දා ඔහුගේ කාර්යාලයෙන් පිටව යාමෙන් අනතුරුවය. එක්නැලිගොඩගේ බිරිඳ සන්ධ්‍යා ප්‍රකාශ කොට සිටියේ තම සැමියා “ආණ්ඩුව විවේචනය කළ නිසා ආණ්ඩුවේ නියෝගයෙන් පැහැර ගන්නා ලදැයි”[13] විශ්වාස කරන බවයි. ඇය හබයාස් කෝපුස් පෙත්සමක් ගොනු කළාය.

---

[8] https://www.icj.org/wp-content/uploads/2012/06/Sri-Lanka-mass-detention-LTTE-analysis-brief-2010.pdf
[9] https://mfa.gov.lk/foreign-minister-speaks-in-parliament-on-removal-of-mohan-peiris-from-cjs-office-2/
Hansard: https://www.parliament.lk/uploads/documents/hansard/1423457395025390.pdf
[10] http://archives.dailynews.lk/2011/09/01/news60.asp, 1 SEPTEMBER 2011, Daily News Lanka. New post for former AG.
[11] https://www.omct.org/files/2011/12/21543/omctcat_eng2.pdf accessed Nov. 13, 2020.
[12] https://reliefweb.int/report/sri-lanka/reality-there-may-be-torture-our-law-against-torture-fine accessed Nov. 13, 2020.
§13, CAT/C/LKA/CO/3-4, *Consideration of reports submitted by States parties under article 19 of the Convention Concluding observations of the Committee against Torture,* 8 Dec. 2011.
https://tbinternet.ohchr.org/_layouts/15/treatybodyexternal/Download.aspx?symbolno=CAT%2fC%2fLKA%2fCO%2f3-4&Lang=en
[13] https://cpj.org/2011/11/sri-lankas-savage-smokescreen/

එක්නැලිගොඩගේ ඉරණම ගැන වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවේදී ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් විමසන ලදී. 2011 දී ලිඛිත ප්‍රතිචාරයක් දෙමින් ආණ්ඩුව ප්‍රකාශ කළේ අතුරුදහන් වීම පොලිසිය විසින් විමර්ශනය කෙරෙමින් පවතින බවයි.[14] එහෙත්, ප්‍රශ්න කිරීමේදී මොහාන් පීරිස් වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවට කියා සිටියේ මහත් ප්‍රසිද්ධියක් ලත් එම අතුරුදහන් වීම රැවටිල්ලක් බවයි.

"... අපට දැනට තියෙන තොරතුර තමයි ... එක්නැලිගොඩ මහත්තයා ...විදේශ රටක රැකවරණ ලබා සිටින බව... ඒ ගැන අපිට සෑහෙන සහතිකයක් තියෙනවා."[15]

මේ සම්බන්ධයෙන් විමසූ කළ එක්සත් ජනපදය විසින් 'දිරිය කත'[16] ලෙස 2017 දී සම්මානයට පාත්‍ර කරන ලද සන්ධ්‍යා එක්නැලිගොඩ මෙසේ ප්‍රකාශ කර තිබුණි:

"පීරිස් කිව්ව විදියට මගේ මහත්තයා හැංගිලා ඉන්නවා නම්, එයා කවදාවත් මට කතා කරන්නේ නැතිව ඉන්නේ නෑ. එයා අපේ දරුවන්ට ආදරෙයි. එයා අපිට මේ තරම් දුකක් දෙන්නේ නෑ. මොහාන් පීරිස් කියනවා මගේ මහත්තයා ඉන්නේ කොහෙද කියලා එයා දන්නවා කියලා. ඒ කතාව ඇත්තනම්, මං කියන්නේ මට එයාව ගෙනත් දෙන්න කියලයි."[17]

ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් ක්‍රියාධරයන් කෝප ගන්වන්නට හේතුවූ ඔහුගේ ප්‍රකාශය සම්බන්ධයෙන් සන්ධ්‍යා එක්නැලිගොඩ UNCAT ලේකම් ජොආවෝ නතාෆ් හට මෙසේ ලියුවාය:

"මට, මගේ දරුවන්ට සහ ශ්‍රී ලංකාවේ අධිකරණයට මේ කිසිදු තොරතුරක් ඉදිරිපත් නොකර එම කරුණු අපගෙන් වසං කිරීම නිසා මොහාන් පීරිස් මහතා ඔබේ කමිටුව හමුවේ කරන ලද ප්‍රකාශය වගකීම් විරහිතව සහ වංක චේතනාවෙන් යුතුව කරන ලද ක්‍රියාවක් බව මගේ විශ්වාසයයි."[18]

ස්වකීය ප්‍රකාශය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ සාක්ෂි දීම සඳහා 2012 දී කැඳවන ලද සිතාසියට එරෙහිව අභියාචනා කිරීමේ නිෂ්පල උත්සාහයක පීරිස් නිරත වූ අයුරු ඇම්නස්ටි ජාත්‍යන්තරය 2013 දී පලකළ ශ්‍රී ලංකාවේ විසම්මුතියට බැට දීම ප්‍රකාශනයේ විස්තර කෙරේ.[19] ඉදිරිපත් වූ පසු ඔහු අධිකරණයට මෙසේ කියා සිටි බව වාර්තා විය:

"ඔහු ජීවතුන් අතර ඉන්නවාද නැද්ද මා දන්නේ නෑ. ඔහු ගැන මට ලැබුණු තොරතුරු ඇත්තදැයි දන්නේ දෙවියන් පමණයි. ඔහු ජීවත් වන්නේද කියා ආණ්ඩුව වත් දන්නවා ඇතැයි මම හිතන්නේ නැහැ,' යි කී ඔහු ප්‍රගීත් විදේශ ගතවූ බව අසන්නට ලැබුණේ කොහෙදීදැයි මතක නැති බවද පැවසුවේය".[20]

**මාධ්‍යවේදී ජේ එස් තිස්සනායගම්**

ධෛර්ය සහගත හා සදාචාර සම්පන්න මාධ්‍යවේදය[21] සඳහා වන පීටර් මැක්ලර් සම්මානයෙන් පුද ලද දෙමළ මාධ්‍යවේදී ජේ එස් තිස්සනායගම්[22] හා සම්බන්ධ තවත් ප්‍රකට සිද්ධියක් තිබේ.

---

[14] "117. An investigation into the abduction of Prageeth Ekneligoda is being conducted by the Homagama Police and by the CCD. Facts have been reported to the Magistrate's court of Homagama under case No: B/7417/10. Investigation is being continued. So far no one has been arrested in this connection. Further progress reports will be filed in Court on 24 October 2011". https://documents-dds-ny.un.org/doc/UNDOC/GEN/G16/121/63/PDF/G1612163.pdf?OpenElement List of issues in relation to the third and fourth periodic report of Sri Lanka. https://tbinternet.ohchr.org/_layouts/15/treatybodyexternal/Download.aspx?symbolno=CAT%2fC%2fLKA%2fQ%2f3-4%2fAdd.1&Lang=en Addendum, Replies of Sri Lanka to the list of issues, received October 2021.

[15] Transcript on file.
Also https://cpj.org/2011/11/sri-lankas-savage-smokescreen/ accessed Nov. 13, 2020 and http://www.humanrights.asia/news/ahrc-news/AHRC-STM-171-2011/

[16] https://www.dailynews.lk/2017/03/29/local/111890/sandya-eknaligoda-recipient-international-women-courage-award

[17] https://cpj.org/2011/11/sri-lankas-savage-smokescreen/

[18] https://www.scoop.co.nz/stories/WO1112/S00158/sri-lanka-letter-to-un-cat-over-mohan-peiris-claim.htm accessed Nov. 13, 2020

[19] https://www.bbc.co.uk/news/world-south-asia-18332987
"Under cross-examination, he said he could not recall which government department gave him the information that Mr Ekneligoda was alive".

[20] https://www.scoop.co.nz/stories/WO1112/S00158/sri-lanka-letter-to-un-cat-over-mohan-peiris-claim.htm accessed Nov. 13, 2020,"Peiris had told the U.N. Committee Against Torture that Eknelygoda took refuge in a foreign country and that the campaign to solve his disappearance is a hoax–although he failed, then and ever since, to provide information about where Eknelygoda has supposedly fled. The government's attorney, appearing before the magistrate, argued that because Peiris had been speaking on behalf of the government at the U.N., he cannot be held responsible for his remarks and need not appear in court. The attorney said officials are not required to disclose communications where "the public interest would suffer," according to a person monitoring the court's hearings". https://cpj.org/2013/01/in-sri-lanka-justice-for-eknelygoda-is-a-waiting-g/

[21] https://rsf.org/en/news/j-s-tissainayagam-named-first-winner-peter-mackler-award-courageous-and-ethical-journalism
https://blog.amnestyusa.org/asia/obama-salutes-tissainayagam/

[22] https://www.amnestyusa.org/files/asa370032013en.pdf accessed Nov. 13, 2020

2008 දී අත් අඩංගුවට ගන්නා ලද තිස්සනායගම්ට, ඔහු විසින් සංස්කරණය කරන ලද නෝර්ත්ඊස්ටර්න් මන්ත්ලි සඟරාවට 2006 දී ලියන ලද ලිපි දෙකක් ඔස්සේ වාර්ගික හා ආගමික ආතතිය ඇවිස්සූ බවට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ නඩු පවරන ලදී. සඟරාවේ ප්‍රකාශක වී. ජසිකරන් සහ ඔහුගේ සහකාරියද අත්තනෝමතික ලෙස රඳවා තබාගෙන කුරිරු ලෙස වධබන්ධනයට පමුණුවා නඩු පැවරීමකින් තොරවම 2009 ඔක්තෝබරයේ දී නිදහස් කර යවන ලදී. තිස්සනායගම් එම ලිපි ලියුවේ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත අත්හිටුවා සටන් විරාමයක් ක්‍රියාත්මක කෙරුණු 2006 දීය. නෛතික වශයෙන් ගත්කල, 2006 දී ලියූ ලිපියක් සම්බන්ධයෙන් 2008 දී නඩු පැවරීම නීතිය අතීතයට බලපාන ආකාරයෙන් නීතිවිරෝධී ලෙස යොදා ගැනීමකි. අත්තනෝමතික ලෙස මාස පහක් රඳවා තබා ගැනීමෙන් අනතුරුව නීතිපති විසින් ගොනු කරන ලද අධිචෝදනා පදනම් වූයේ බලහත්කාරයෙන් ලබාගත් පාපෝච්චාරණයක් මත පදනම්ව බවට චෝදනා කෙරේ. “තමන් මානසික වධයට පාත්‍ර කළ පොලිසිය පාපෝච්චාරණය ලබා ගත්තේ බලහත්කාරයෙන් බව තිස්සනායගම් තරයේ පවසයි,”[23] යන්න ඇම්නස්ටි ජාත්‍යන්තරයේ නිරීක්ෂණය විය. එසේ තිබියදී, පාපෝච්චාරණය පිළිගත හැකි එකක් සේ භාරගත් කොළඹ මහාධිකරණය විසින් මාධ්‍යවේදියා විසි අවුරුද්දකට සිරගෙට නියම කරන ලදී. ජාත්‍යන්තර බලපෑම නිසා 2010 දී ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් සමාව දෙන ලදුව තිස්සනායගම් රටහැර පලා ගියේය.

අත්තනෝමතික ලෙස රඳවා තබාගෙන වධහිංසා පමුණුවනු ලැබූ තිස්සනායගම්ට ඇප දීම ප්‍රතික්ෂේප කිරීමට දායක වූ නීතිපති පීරිස් බිය වැද්දීම් යටතේ ලබාගන්නා ලද පාපෝච්චාරණයක් මත පදනම් වී අධිචෝදනා ගොනු කිරීම ගැනද චෝදනා ලබයි.

මාධ්‍යවේදී තිස්සනායගම් අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම සහ ඔහුට දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ හැසිරීම ද පීරිස් විසින් UNCAT සැසිවාරයේදී ආරක්ෂා කරන ලදී. ජනාධිපති රාජපක්ෂට ලියන ලද ලිපියකින් තිස්සනායගම් විසින් සිය ක්‍රියා සම්බන්ධයෙන් “පසුතැවිල්ල” පල කළ බව පීරිස් කියා පෑවේය. ඔහු මෙසේ පැවසීය: “ඔහු වරදකරු කොට දඬුවම් පනවන ලදී. එහෙත් ඔහුගේ නීතිඥවරුන් මාර්ගයෙන් යවන ලද ලිපියෙන් ඔහු කළ කටයුත්තේ වරදකාරී බව තහවුරු කරන ලදී. ඔහුට සමාවක් දෙන ලදී.” මෙම ප්‍රකාශය වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවට ලියන ලද ලිපියකින් තිස්සනායගම් විසින් දැඩි ලෙස ප්‍රතික්ෂේප කරන ලදී.

“මගේ වරදකාරිත්වයක් පිළිගත් බවට කිසියම්ම හෝ ඇඟවීමක් වේ නම් එය මුළුමනින්ම අසත්‍යයක් බව සඳහන් කරනු කැමැත්තෙමි.”

සමාවක් ලබා ගැනීම සඳහා ජනාධිපතිට ලියූ බව වැඩිදුරටත් සඳහන් කළ ඔහු, එයද තම ලේඛනයෙන් කිසිවකු හෝ අපහසුවට පත්වී නම්, ඊට කනගාටුව පලකිරීම සඳහා පමණක් බව කියා සිටියේය.

“ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා හෝ ආණ්ඩුව හෝ අපහසුතාවට පත් කිරීම අපරාධයක් වන බවට මගේ දැනුවත් කමක් නැති අතර මට චෝදනා නගා තිබුනේ එවන් අපරාධයක් සම්බන්ධයෙන් නොවේ.”[24]

**සමාප්තයි**

---

[23] Ibid.
[24] http://jdsrilanka.blogspot.com/2011/11/tissainayagam-denies-former-attorney.html accessed Nov. 13, 2020

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT